**කාත්තාන්කුඩි නගර සභාව**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කාත්තාන්කුඩි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **ලැබිය යුතු ගිණුම්** | | |
| (i) | විදුලිබල මණ්ඩල අත්තිකාරම් රු. 2,399,352 ක් අඛණ්ඩව වර්ෂ 10 කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කර තිබුණත්, ඒ පිළිබඳ ලේඛන, පොත්පත් සහ සනාථ කළ හැකි සාක්ෂි කිසිවක් නැති අතර හිඟ මුදල් අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අය කිරීමට කටයුතු කළ යුතු වේ. | කාත්තාන්කුඩි නගර සභාව විදුලිබල මණ්ඩලය සමඟ සම්බන්ධ වී පැවැති කාල පරිච්ඡේදයේ ක්‍රියාත්මක කළ ගෙවීම් පදනම්ව රු.2,399,352 ක් විදුලිබල මණ්ඩලයට ලබාදී තිබූ අත්තිකාරම් ලෙස 1986 වර්ෂයේ සිට ඉදිරිපත් කර තිබුණි. |
| (ii) | විශ්‍රාම ගිය, සේවය හැර ගිය, මියගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයකර ගත යුතු හිඟ ණය ශේෂ රු.38,876ක් විශ්‍රාම පාරිතෝෂිතයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙකී ණය නිරවුල් නොකිරීම නිසා මෙම පුද්ගලයින්ට එරෙහිව නිතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවති. |

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.6,642,879ක ණය හිමියන් වර්ෂ 5කට අධික කාලයක සිට හඳුනා ගෙන නිරවුල් කිරීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම කරුණ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් සහ නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අවධානයට යොමුකර ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**1.3.2 ලේඛනගත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 107,215,868 ක් වූ ඉඩම් සම්බන්ධ ඔප්පු හා අනෙකුත් අයිතිය තහවුරු කෙරෙන ලේඛන ආදිය ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | මේ පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහතින දක්වා ඇත.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මුදල් රෙගුලාසි 371 | විවිධ පුද්ගලයන්ට 2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අවස්ථා 32 කදී ලබා දී තිබූ අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. | මෙම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි |

**1.4.2 බදු අවශ්‍යතාවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශ | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්විම |
|---|---|---|
| විවිධ සැපයුම්කරුවන් වෙත ගෙවා තිබුණු එකතු කළ අගය මත බදු වෙනුවෙන් "වැට් ඉන්වොයිසි" (VAT | එකතු කළ අගය මත බදු ගෙවීම් සිදු කිරීමේදී වැට් | පිළිගනිමි |

| | |
|---|---|
| Invoice) ලබාගෙන නොතිබුණි. එසේම ගෙවා තිබූ එකතු කළ අගය මත බදු පිළිබඳව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිට දැනුම් දී නොතිබුණි. | ඉන්වොයිසියක් මත පමණක් කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,410,951 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,689,496 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ හා ඇස්තමේන්තු කළ ආදායම්, බිල්කළ කළ ආදායම්, රැස්කළ ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 19,875,000 | 19,196,489 | 14,520,979 | 4,675,449 | 18,409,850 | 18,359,223 | 14,662,263 | 3,696,960 |
| කුලී | 11,672,500 | 6,159,328 | 6,159,328 | - | 7,501,500 | 5,562,342 | 5,662,342 | -- |
| බලපත්‍ර ගාස්තු | 3,060,000 | 3,412,500 | 3,399,000 | 13,500 | 3,060,000 | 3,110,940 | 3,090,140 | 20,800 |
| අනෙකුත් ආදායම් | 31,153,500 | 28,044,403 | 16,924,628 | 11,119,775 | 26,389,500 | 25,487,741 | 25,487,741 | -- |
| එකතුව | 65,761,000 | 56,812,720 | 41,003,935 | 15,808,724 | 55,360,850 | 52,520,246 | 48,902,486 | 3,717,760 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු. 4,084,020ක් හා සමාලෝචිත වර්ෂයේ බිල් කළ රු.16,929,108 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි |
| (ආ) | නගර සභාවට අයත් පැරණි පුස්තකාල ගොඩනැගිලි සංකීර්ණය, රැකියා පුහුණු මධ්‍යස්ථානය, සංස්කෘතික අමාත්‍යාංශයේ උප කාර්යාලය, කොට්ඨාශ අධ්‍යාපන | මෙම ආයතන සමග ගිවිසුම් ඇති කරගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

කාර්යාලය ආදිය ක්‍රියාත්මක කිරීම අනුමැතිය නගර සභාව විසින් ලබාදී තිබුණත් එම ආයතන සමග කිසිදු බදු ගිවිසුමක් සඳහා එළැඹ නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **අතුරු ව්‍යවස්ථා** | | |
| නගර සභා ආඥා පනතේ 255 අධිකාරය ප්‍රකාරව, නගර සභාවේ ආදායම් විධිමත් කිරීම යන වැදගත් කරුණු පිළිබඳ අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතු වුවත්, නගර සභාව විසින් අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් වූ ඉල්ලීම් නැගෙනහිර පළාත් පාලන අමාත්‍යවරයාගේ එකඟතාවය සඳහා යවා තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 වන විටත් අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ උප රීතීන්ට නැගෙනහිර පළාත් පාලන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතුවේ. | පිළිගනිමි |
| (ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීමේ ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කළ යුතුවේ. | පිළිගනිමි |
| (ඇ) පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ (LGIP) ණය වැඩසටහන යටතේ මාර්ග සහ කානු පද්ධති සංවර්ධනය කිරීමේ අරමුණින් සියයට 09 ක වාර්ෂික පොලියක් මත වර්ෂ 10 කින් ආපසු ගෙවීමේ පදනම මත රු.7,317,456 ක ණය ලබා ගෙන තිබුණි. මෙම මාර්ග විධිමත් අයුරින් සම්පූර්ණ කර නඩත්තු නොකර පැවතුණි. | ප්‍රතිසංස්කරණය නොකළ මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතු වේ. | ප්‍රතිසංස්කරණය නොකළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) **තිරසාර සංවර්ධන අරමුණු** | | |
| 2030 වර්ෂයේ ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් මැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

## 3.2 වත්කම් කළමනාකරණය

### 3.2.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණ | | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නිශ්චල හා චංචල දේපල ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ අදාල වත්කම් සටහන් කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩසටහන යටතේ කවසිමා යන්ත්‍රය සවිකිරීම ඇතුළු ඒ සම්බන්ධ ඉදිකිරීම් කටයුතු 2019.06.10 දි ආරම්භ කර 2019.08.19 දින අවසන් කිරීම සඳහා රු. 77,796,553 ක වටිනාකමට ගිවිසුම්ගතව තිබුණි. නමුත් කොන්ත්‍රාත් කාර්යයන් 2019 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණු අතර රු.29,920,986ක් ගෙවා තිබුණි. | අදාල වැඩසටහන නියමිත කාලවකවානුව තුළ අවසන් කළ යුතුවේ. | අමාත්‍යවරයා විසින් 2020 අගෝස්තු මාසය ඇතුළත වැඩසටහන අවසන් කළ යුතු බවට දැනුම් දී ඇත. |

### 3.2.2 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

| විගණන නිරීක්ෂණ | | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකත්ව මුදල් ප්‍රේෂණය නොකිරීම.<br>විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 2/2011 දරන චක්‍රලේඛය ප්‍රකාරව, අනියම් හා තාවකාලික සේවකයින්ගේ දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කළ යුතුයි. කෙසේ වෙතත්, 2015, 2016 සහ 2017 වර්ෂවලදී පත්වීම් ලැබූ සේවකයින් 77 දෙනෙකු වෙනුවෙන් වූ දායක මුදල් ඔවුන්ගේ වැටුපෙන් අඩුකර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අදාළ සියලු සාමාජිකයින්ගේ දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කළ යුතු වේ. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |

**(ආ)** පුස්තකාල ගොඩනැගිල්ල කුලියට දීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තක්සේරු දෙපාර්තමේන්තුව පුස්තකාල ගොඩනැගිල්ලේ මාසික කුලිය රු. 125,000 ක් තක්සේරු කර තිබුණු නමුත් 2014 වර්ෂයේදී, වර්ෂ 04 ක කාලපරිච්ඡේදයක් සඳහා රු.5,000 ක මාසික කුලියක් මත පුද්ගලික අධ්‍යාපන ආයතනයකට මෙම ගොඩනැගිල්ල සභාව විසින් කුලියට ලබා දී තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සභාව විසින් රු.4,755,000 ක කුලියක් අහිමි කර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව පුස්තකාල ගොඩනැගිල්ල සඳහා රු.125,000 ක මාසික කුලියක් අය කළ යුතු වේ. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |

**3.3 ප්‍රසම්පාදනය**

**3.3.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුයි. | පිළිගනිමි. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | සභාවේ කටයුතු සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය. | පිළිගනිමි. |